# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,393 - 2024 ජූලි මස 12 වැනි සිකුරාදා - 2024.07.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 602 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 604 |


### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 අගෝස්තු 02 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ජූලි 19 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## කැස්බෑව නගර සභාව

255 අධිකාරය වන 1939 අංක 61 නගර සභා ආඥාපනතේ 52 වන වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැන්වීම

255 අධිකාරය වන 1939 අංක 61 නගර සභා අඥාපනතේ 52 වගන්තිය ප්‍රකාර බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැස්බෑව නගර සභා සීමාවේ පිහිටි මෙයට යාකොට ඇති උපලේඛනයේ දක්වා ඇති අංක 1 සිට 5 දක්වා මංමාවත් කැස්බෑව නගර සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බවට ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

### උපලේඛනය

| අනු. අංකය | මාර්ගයේ නම | පාරේ දිග මීටර් | පාරේ පළල මීටර් | ආරම්භක වරිපනම් අංකය | අවසාන වරිපනම් අංකය |
|---|---|---|---|---|---|
| 01 | ඇරැව්වල බටහිර ග්‍රාම සේවා වසමේ බටහිර ඇරැව්වල "විරෝධාර මාවත" පළමු පටුමග (පළමුව දකුණට පාර) | 232 | 12 | 7/125 | 7/127බී |
| 02 | 565 බටකැත්තර උතුර ග්‍රාම සේවා වසමේ "සැන්රෝස් උද්‍යානයේ පළමු හරස් මාර්ගය" | 182 | 09/06 | 516/98 | 51/60 A |
| 03 | 566 දම්පේ ග්‍රාම සේවා වසමේ ගංගාරාම විහාර මාවතේ "ආසිරි උයන" මාර්ගය | 68.6 | 4.5 | 62/32 | 62/28 හා 62/32/3 |
| 04 | 654 ජඹුරලිය ග්‍රාමසේවා වසමේ බටුවන්දර මඩපාත පාරේ 4 වන පටුමග හා එහි අතුරු මාර්ගය 4 වන පටුමග II වන කොටස යන මාර්ග<br>1. 4 වන පටුමග | 79 | 4.57-6.1 | 137 | 15/11 |
| | 2. 4 වන පටුමග දෙවන කොටස | 33.5 | 3.65 | 135/5 | 135/4 |

පී. ඩබ්ලිව්. ටී. කල්හාරි නන්දසේන,
ලේකම් හා සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කැස්බෑව නගර සභාව.

2024 ජුනි මස 28 වැනි දින,
කැස්බෑව නගර සභා කාර්යාලයේ දී ය.

07-426

---

## රජ්ගම ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, රජ්ගම ප්‍රාදේශීය සභාව විසින් 2024/05/22 දින තීරණ අංක L 577 යටතේ මෙහි පහත සඳහන් යෝජනාව සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. ඩී. ශ්‍යාමා පුෂ්පමාලි,
ලේකම්,
රජ්ගම ප්‍රාදේශීය සභාව.

2024 ජුනි මස 19 වැනි දින.

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, රජ්ගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වරිපනම් කාර්යය සඳහා යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමේ කාර්ය සඳහා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කෙරෙන සංවර්ධන කාර්යයන් සැළසුම් කිරීම පහසු කිරීමත් සහ 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 3 වන සහ 5 වන වගන්තිවල කාර්යය සඳහා තොරතුරු පද්ධතියක් නිර්මාණය කර ගැනීම සඳහා ද එකී යම් දේපළක අයිතිකරුට සහ පදිංචිකරුට එහි කුලිය හෝ වාර්ෂික වටිනාකම හෝ එහි විශාලත්වය සහ වෙනත් කරුණු පිළිබඳ වාර වාර්තා සැපයීමට නියම කළ යුතු යැයි රජ්ගම ප්‍රාදේශීය සභාව යෝජනා කරයි."

07-363

---

**හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව**

විනෝදබදු පැනවීම

හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා පරිපාලන සීමාව ඇතුළත පිහිටි ප්‍රදේශවල පැවැත්වෙන විනෝද කටයුතුවලින් 10%ක් වූ අනුපාතයක විනෝද බද්දක් පනවා අය කිරීමට 2023.02.15 දිනැති අංක (05)-(i)-04 යටතේ වූ සභා තීරණය සඳහා උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව මෙයින් නිවේදනය කරමි.

ආර්. ඒ. හේමකාන්ති,
ලේකම් හා බලතල කාර්ය
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව,
හිඟුරක්ගොඩ.

07-372

---

සංශෝධනයයි

**මාතලේ ප්‍රාදේශීය සභාව**

1893 අංක 09 දරන ගෝඝාතක ආඥාපනත යටතේ විරෝධතා කැඳවීම

**තීරණය**

මාතලේ ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂයේ ගෝඝාතක ආඥාපනත යටතේ සත්ත්ව ඝාතකාගාර පවත්වාගෙන යාම වෙනුවෙන් විරෝධතා කැඳවීම ඇතුළත් නිවේදනය 2024.04.05 වැනි දින පළකරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළාත් පාලන *ගැසට් පත්‍රයේ* IV(ආ) වැනි කොටසේ පළකිරීමට කටයුතු සළස්වා තිබූ අතර, එම *ගැසට් පත්‍රයේ* පළකරන ලද පලාපත්වල, කෝන්ග හමුල, ලොක්නගර් වත්තෙහි පදිංචි **ආර්. එස්. එම්. ද සිල්වා යන අය නම** වෙනුවට පලාපත්වල, කෝන්ගහමුල, ලොක්නගර් වත්තෙහි පදිංචි **ආර්. එස්. එම්. ද අල්විස් යන නමින්** සංශෝධනය වන බවත්, 1893 අංක 09 දරන ගෝඝාතක ආඥාපනගේ 03 වන වගන්තියේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව මාතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂය සඳහා ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා පහත උපලේඛනයේ දක්වා ඇති අය වෙනුවෙන් බලපත්‍ර ලබාදීම පිළිබඳව විරෝධතා කැඳවනු ලබන අතර, ඒ සඳහා මාතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි හා ජීවත් වන අයෙක් හෝ අයවලුන් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුවක් පදනම් කරගෙන ද යන්න පිළිබඳ විස්තර ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ දා සිට දින 14 ක් ඇතුළත මාතලේ ප්‍රාදේශීය සභාව වෙත දන්වා එවිය යුතු බව ගෝඝාතක ආඥාපනතේ 7(2) වගන්තිය ප්‍රකාරව මාතලේ ප්‍රාදේශීය සභාව තීරණය කරන්නීය.

***උපලේඛනය***

| *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *සත්ත්ව ඝාතකාගාරය පවත්වාගෙන යන ස්ථානය* | *සත්ත්ව වර්ගය* |
|---|---|---|
| ආර්. එස්. එම්. ද අල්විස්,<br>ලොක්නගර් වත්ත,<br>කෝන්ගහමුල,<br>පලාපත්වල | ලොක්නගර්වත්ත,<br>කෝන්ගහමුල, පලාපත්වල | ඌරු මස් |

07-100

# විවිධ දැන්වීම්

## සංශෝධනයයි

### පන්විල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා බදු පැනවීමට අදාළ ගැසට් නිවේදන සංශෝධනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2023.11.24 දින පළකරන ලද අංක 2360 දරන *ගැසට්* පත්‍රයේ IV(ආ) කොටස - පළාත් පාලනය යටතේ ඇති පන්විල ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂයට අදාළ බදු පැනවීමේ *ගැසට්* නිවේදනයේ සංශෝධනයන් සිදු කිරීම 2024 වර්ෂයේ මාර්තු මස 06 වන දින තීරණ අංක 1028 යටතේ පහත ආකාරයට තීරණය කළ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

කේ. පී. එස්. ඩී. පතිරණ,
ලේකම්,
පන්විල ප්‍රාදේශීය සභාව

2024 මාර්තු මස 06 වැනි දින,
පන්විල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01. නිවේදන අංක 11-584/3 යටතේ "2023 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම" ලෙස පළ වී ඇති මාතෘකාව "2024 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම" ලෙස සංශෝධනය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

02. නිවේදන අංක 11-584/8 යටතේ "2023 වර්ෂයට කසල ගාස්තු පැනවීම" ලෙස පළවී ඇති කරුණ "2024 වර්ෂයට කසල ගාස්තු පැනවීම" ලෙස සංශෝධනය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

03. 2024 වර්ෂයට ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු පැනවීම පිළිබඳ නිවේදන අංක 11-584/10 යටතේ පළ වී ඇති කරුණු පහත ලෙස සංශෝධනය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

**2024 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පිළිබඳ ගාස්තු පැනවීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් පන්විල ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පිළිබඳ ගාස්තු නියම කිරීමට අදාළව 2023.09.27 දිනැති තීරණ අංක 516 යටතේ, 2023.11.24 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාද ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි IV (ආ) කොටසේ පළකරන ලද තීරණය, පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට 2024.03.18 දින තීරණ අංක 1046 යටතේ තීරණය කළ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

***තීරණය***

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122, 126 වගන්තියෙන් සහ 1952 අංක 06 දරන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ II වන වගන්තියෙන් මධ්‍යම පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මධ්‍යම පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016.02.23 වැනි දින අංක 1955/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ IV (අ) වැනි කොටසේ ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 13 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, එකී පනතේ III වන වගන්තියෙන් පන්විල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වැළඳගත් හා ඒ බව 2022.03.04 වැනි දින අංක 2270 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පන්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ, යම් වීදියකට, පාරකට, ඇළකට, මුහුදකට, අහසට පෙනෙන පරිදි වර්ග අඩියකට නොඅඩු දැන්වීමක් හෝ ඉදිකිරීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් පනවා අය කළ යුතු යැයි තීරණය කරමි.

04. 2024 වර්ෂයට නිවාස දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටි කර විකිණීම හා ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම් පිළිබඳ නිවේදන අංක 11-584/12 යටතේ පළ වී ඇති කරණ පහත පරිදි සංශෝධනය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

**තීරණය**

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ කියැවෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 221(අ) වගන්තිය සමග කියවිය යුතු 122 හා 126 වැනි වගන්ති වලින් ප්‍රාදේශීය සභාවලට බලය ලැබී ඇති විධිවිධාන මත 2024.01.01 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි නිවාස දේපළ සංවර්ධය හා ඉඩම් කට්ටිකර විකිණීම හා ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම් මත පහත දැක්වෙන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට හා නව ගාස්තු අය කිරීමට තීරණය කරමි.

නිවාස දේපළ සංවර්ධනය කිරීම හා ඉඩම් කට්ටි කර විකිණීම :

ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම් :

01. වර්ග අඩි 750 දක්වා (ගෘහස්ථ) රු. 2,000.00
02. වර්ග අඩි 751 සිට වැඩි වන (ගෘහස්ථ) සෑම වර්ග අඩි 10 කට හෝ කොටසකට හෝ රු. 100 බැගින් අය කෙරේ.
03. වර්ග අඩි 750 දක්වා (වාණිජ) රු. 3,500.00
04. වර්ග අඩි 751 සිට වැඩි වන සෑම වර්ග අඩියකටම රු. 150 බැගින් අය කෙරේ. (වාණිජ)
05. සීමා බැමි දික් අඩි 01 ක් සඳහා රු. 100.00

05. 2024 වර්ෂයට අනවසර ඉදිකිරීම් සඳහා දඩ ගාස්තු පිළිබඳ නිවේදන අංක 11-584/15 යටතේ පළ වී ඇති කරුණු පහත පරිදි සංශෝධනය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

06. අනවසර ඉදිකිරීම් සඳහා දඩ ගාස්තු :

1. අනුමැතියකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම්/එකතු කිරීම්/නැවත ඉදිකිරීම්

| | | *(නේවාසික) ව. මී. 1ට රු. ශත* | *(නේවාසික නොවන) ව. මී. 1ට රු. ශත* |
|---|---|---|---|
| i. | අත්තිවාරම් වැඩ පමණක් සම්පූර්ණ කර ඇති විට (කයිරු මට්ටම දක්වා) | 50.00 | 250.00 |
| ii. | වහල මට්ටම දක්වා ඉදිකිරීම් ටැම් හා බාල්ක ඇතුළුව ඉදිකර ඇති විට (වහලය හැර) | 100.00 | 700.00 |
| iii. | වහලය සහිත බිත්ති ඉදිකිරීම | 200.00 | 1,000.00 |
| iv. | පදිංචිය සඳහා සුදුසු පරිදි ඉදිකිරීම් සම්පූර්ණ කිරීම | 300.00 | 1,500.00 |
| v. | මායිම් තාප්ප/රැඳවුම් බිත්ති ඉදිකිරීම | 150.00 | 350.00 |

| vi. | විදුලි සංදේශ, සම්ප්‍රේෂණ හා ඇන්ටනා කුළුණු ඉදිකිරීම | |
|---|---|---|
| | • බිම් පාද ඉදිකිරීම | රු. 150,000.00 |
| | • වහල මුදුන ඉදිකිරීම | රු. 100,000.00 |

2. අනුකූලතා සහතිකය (COC) ලබා නොගෙන පදිංචි වීම

- දිනකට රු. 50.00

06. 2024 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම පිළිබඳ නිවේදන අංක 11-584/13 යටතේ පළවී ඇති කරුණු පහත ලෙස සංශෝධනය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ 153 වැනි වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පන්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත පිහිටි

ගොඩනැගිලි ඉදිකිරීමට හෝ නිත්‍ය හෝ ස්ථාවර *නැතහොත්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ඒ ඉඩමේ ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ,

(ආ) ඒ ඉඩම විධිමත් ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක හෝ,

(ඇ) ඒ ඉඩම ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය හෝ වගා කිරීමට යටත් බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම ප්‍රමාණය අතර ඇති අනුපාතය 60% ට වඩා අඩු වන්නේ නම් එකී ඉඩම සංවර්ධනය නොකල ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2024 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන බිම් අගයෙන් 0.05% ක බද්දක් පැනවීමටත් අදාළ මුදල පන්විල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු යැයි ද තීරණය කරමි.

07. 2024 වර්ෂය සඳහා බල ප්‍රදේශය ඇතුලත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජකයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන අවස්ථාවක බදු පැනවීම පිළිබඳ නිවේදන අංක 11-584/13 යටතේ පළ වී ඇති කරුණ පහත ලෙස සංශෝධනය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ 154(1) වැනි වගන්තිය යටතේ පන්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජකයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1% ක සමාන බද්දක් විකුණුම්කරුවෙකු හෝ වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයාහෝ අනුයෝජකයා විසින් පන්විල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට පනවා අය කළ යුතු යැයි තීරණය කරමි.

08. 2024 වර්ෂය සඳහා සේවා සැපයීම වෙනුවෙන් ගාස්තු පිළිබඳ නිවේදන අංක 11-584/13 යටතේ පළ වී ඇති කරුණේ යෝජනාව ලෙස සඳහන් ස්ථාන තීරණය ලෙස පහත පරිදි සංශෝධනය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ අනුව 2024 වර්ෂයට අදාළව පන්විල ප්‍රාදේශීය සභාව විසින් සේවා සැපයීම වෙනුවෙන් ගාස්තු පහත සඳහන් උපලේඛනය අනුව පනවා අය කළ යුතු යැයි තීරණය කරමි.

09. 2024 වර්ෂයට කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු පිළිබඳ නිවේදන අංක 11-584/13 යටතේ පළ වී ඇති කරුණ පහත ලෙස සංශෝධනය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

06. කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු ඃ

| *කොන්ත්‍රාත් වටිනාකම (රු. ශත)* | *අය කරනු ලබන ගාස්තුව (රු. ශත)* |
|---|---|
| 0 - 1000,000.00 දක්වා | 1,000.00 |
| 10,00,001.00 - 20,00,000.00 දක්වා | 2,000.00 |
| 20,00,001.00-50,00,000.00 දක්වා | 2,500.00 |
| 50,00,001.00 - 100,00,000.00 දක්වා | 3,000.00 |
| 100,00,000.00 ට වැඩි | 3,500.00 |

07-442

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.